ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 ව්‍යාචනය කළ මතය

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2 ව්‍යාචනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාචනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ ව්‍යාචනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 40 ඡේදය අනුව වත්කමක් ප්‍රත්‍යාගණනයේ දී අදාල වත්කම් කාණ්ඩයම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද ඊට පටහැනිව කරන්දෙණිය පිහිටි ගොඩනැඟිල්ල සහ ලිදුල සංචාරක බංගලාව ප්‍රත්‍යාගණනය නොකර ඉතිරි ගොඩනැගිලි පමණක් ප්‍රත්‍යාගණනය කර තිබුණි.	2024 මූල්‍ය වාර්තා පිළියෙල කරන අවස්ථාව වන විට කරන්දෙණිය හා ලිදුල ගොඩනැගිලි තක්සේරු වර්තා නොලැබී තිබීම හේතුවෙන් ඒවායේ ප්‍රත්‍යාගණන වටිනාකම් ගැලපීම් කිරීමට නොහැකි වී ඇත.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති අනුව සියලු ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	ප්‍රත්‍යාගණනයට පෙර රු. 14,804,400 ක්වූ ගොඩනැඟිලි රු.17,900,000 ක වටිනාකමට ප්‍රත්‍යාගණනය කර, මුළු ප්‍රත්‍යාගණිත වටිනාකම ගිණුම්ගත කර ඇතත් පෙර වටිනාකම වූ රු.14,800,400 ගිණුමෙන් ඉවත් නොකිරීම නිසා ගොඩනැඟිලිවල පිරිවැය එම පෙර වටිනාකමින් ද, ප්‍රත්‍යාගණනය කරන ලද ගොඩනැඟිලිවලට අදාලව ප්‍රත්‍යාගණිත අතිරික්තයට බැර කළ යුතු මුදල රු.7,161,122 ක් වුවත් රු.17,900,000 ක් බැර කිරීම හේතුවෙන් ප්‍රත්‍යාගණන අතිරික්තය රු.10,738,876 කින් ද අධිගණනය වී තිබුණි.තව ද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 90 ඡේදය අනුව දේපළ පිරියත හා උපකරණ පන්තියක් ප්‍රත්‍යාගණිත අගයන්ට ප්‍රකාශ කර ඇති විට හෙළිදරව් කල යුතු කරුණු හෙලිදරව් කර නොතිබුණි.	ගොඩනැගිලි වල වාර්ෂික ක්ෂය ගණනය කරනු ලබන අවස්ථාවේදි වරදක් සිදු වි ඇති අතර, එය 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දි එය නිවැරදි කරනු ලැබේ.තවද මොණරාගල, පුත්තලම සහ රත්නපුර යන දිස්ත්‍රික් කාර්යාල නැවත ප්‍රත්‍යාගණනය කර අප වෙත ලැබුණු අතර එය ගිණුම්ගත කිරීමේ දි අදාල වැඩි වීම පමණක් ගිණුම්ගත නොකොට සම්පූර්ණ වටිනාකම ම නැවත ගිණුම්ගත කර ඇත. එය නොදැනුවත්ව සිදු වූ වරදක් බවත්, 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දි නිවැරදි කිරීමටත්, දේපළ, පිරියත හා උපකරණ පන්තියක් ප්‍රත්‍යාගණිත අගයන්ට ප්‍රකාශ කර ඇති විට හෙළිදරව් කල යුතු දෑ මූල්‍ය ප්‍රකාශ තුල ඇතුලත් නොකිරීම සම්බන්ධයෙන් සිදු වූ වරද 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දි සටහනක් යොදා නිවැරදි කරනු ලැබේ කටයුතු කරනු ලැබේ.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති අනුව, ප්‍රත්‍යාගණන ප්‍රතිඵලය නිවැරදිව ගිණුම් ගත කිරීමටත්, ව්‍යවහාර කළ ක්‍රම සහ වැදගත් උපකල්පනයන් ආදිය හෙළිදරව් කිරීම කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1972 වර්ෂයේ කොමිෂන් සභාව පිහිට වූ දින සිට අත්පත් කරගත් ඉඩම් බැහැර කිරීමෙන් තවදුරටත් සභාව සතුව පවතින බවට හඳුනාගත් ඉඩම් ප්‍රමාණය ඉඩම් ලේඛණයට අනුව (බදුදී ඇති ඉඩම් හෙක්ටයාර් 4,833 ක් ඇතුළත්ව) හෙක්ටයාර් 279,208 ක් වුවත් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල හෙක්ටයාර් 2,144 ක් පමණක් තක්සේරු කර එහි වටිනාකම ලෙස රු.905,285,000 ක් මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කර තිබුණි.	තක්සේරු කිරීම සඳහා ඉඩම් මැණුම් කර පිඹුරු ලබාදිය යුතු වුවත් සියලු ඉඩම් එසේ මැණුම් කර නැති අතර මැණුම් කරන ලද බදු ඉඩම් තක්සේරු කිරීම සඳහා යොමුකර ඇත. 2023.12.31 දිනට බදු ඉඩම් සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් කොමිෂන් සභාව වෙත ලැබී ඇති තක්සේරු වටිනාකම් පමණක් ගිණුම් මඟින් ඉදිරිපත් කර ඇත.එම තක්සේරු වටිනාකම් ලැබෙන ආකාරය අනුව ගිණුම්වල ඇතුලත් කිරීමට සිදු වේ. දැනට ඉඩම් වලින් කොටසක් ප්‍රත්‍යාගණනය කොට මූල්‍ය වාර්තා වල ඇතුළත් කර ඇති අතර, ඒ අනුව 2024.12.31 දිනට ඉඩම්වල වටිනාකම රු.905,285,000 ක් ලෙස දක්වා ඇත.තක්සේරු දෙපාර්තමේන්තුවෙන් මේ පිළිබඳව උපදෙස් විමසීමේදී දැනුම් දී ඇත්තේ කොම්ප්ට්‍රෝලර් ජනරාල් වක්‍රලේඛ අනුව තක්සේරු දෙපාර්තමේන්තුව හරහා තක්සේරු කළයුතු බවයි.	පවත්නා ඉඩම් යාවත්කාලීන වටිනාකම් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කළ යුතුය.
(ආ)	1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත ප්‍රකාරව වතු සමාගම් වලින් හා පුද්ගලයින්ගෙන් පවරාගත් ඉඩම් වෙනුවෙන් ගෙවිය යුතු වන්දි මුදල 2024 දෙසැම්බර් 31 දිනට රු. 215,488,388 ක් වූ අතර ඒ සඳහා ඉදිරිපත් කල උපලේඛන දෙකෙහි (අදියර I හා II) වන්දි ගෙවීම් සම්බන්ධයෙන් පිළිගත හැකි සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් එම ශේෂයේ නිර්වද්‍යතාව තහවුරු කර ගත නොහැකි විය.	වන්දි ගෙවීම් පිළිබඳව අවශ්‍ය තොරතුරු ඉල්ලා ඇති අවස්ථාවක ඉදිරිපත් කිරීමට හැකි බව දන්වා සිටිමි.	පවරාගත් ඉඩම් වෙනුවෙන් ගෙවන ලද වන්දි හා ගෙවිය යුතු වන්දි සම්බන්ධයෙන් ලේඛන යාවත්කාලීන කර නිවැරදිව පවත්වා ගත යුතුය.
(ඇ)	ගොඩනැඟිලිවල වාර්ෂික ක්ෂය ගිණුම්ගත කිරීමේ දී රු.2,703,876 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම වටිනාකමින් අඩු වී සමුච්චිත ක්ෂය එම වටිනාකමින් වැඩි වී තිබුණි.	ගොඩනැඟිලිවල වාර්ෂික ක්ෂය ගණනය කරනු ලබන අවස්ථාවේ දි වරදක් සිදු වී ඇති අතර, එය 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ පිලියල කිරීමේ දි නිවැරදි කරනු ලැබේ.	වාර්ෂික ක්ෂය හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.

(ඇ)	සමාලෝචිත වර්ෂය තුළ ඉඩම් විකුණුම් අත්තිකාරම් ලෙස ලබාගත් රු.1,460,000 ක් විකුණුම් ආදායම තුළ ඇතුළත් කර ඇති බැවින් එම වටිනාකමින් විකුණුම් ආදායම අධිගණනය වී තිබුණි.	මෙය 2025 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. මින් ඉදිරියට ඉඩම් විකුණුම් අත්තිකාරම් මුදල්, ඉඩම් විකුණුම් අත්තිකාරම් ගිණුමට පමණක් බැර කිරීමට ආයතනයේ සියළු අංශ සහ දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ.	වර්ෂයේ බදු කුලී ආදායම් හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඉ)	2022 හා 2023 වර්ෂ දෙකට අදාළව මුහමලෙයි තෝට්ටම් ඉඩම් බදුදීම් සඳහා ලැබුණු රු.660,000 ක බදු මුදල සමාලෝචිත වර්ෂයේ බදුකුලී ආදායම ලෙස ගිණුම්ගත කර තිබූ බැවින් එම වටිනාකමින් සමාලෝචිත වර්ෂයේ බදුකුලී ආදායම අධිගණනය වී තිබුණි	රන්බිම නවෝදය යටතේ වාර්ෂික බදු පදනමින් ලබාදුන් යාපනය දිස්ත්‍රික්කයට අදාලව බදු දැන්වීම් යොමු කර තිබුණේ 2021 වසරේදි වන අතර ඒ සඳහා 2022,2023 හා 2024 වසර වලට අදාලව එකවර බදු මුදල් 2024 වසර තුල අවස්ථා කිහිපයකදි ගෙවා ඇත. එම ගෙවූ මුදලද යාපනය දිස්ත්‍රික් කාර්යාලය මඟින් මැණික් ආදායම් ලෙස වැරදි ලෙස රිසිට් පත් නිකුත්කර එම රිසිට් පත පවා ආදායම් අංශය වෙත යොමුකර නොතිබුණි. එයද නිවැරදි කර වාර්ෂික බදු පදනමින් ලබා දී තිබූ නිසාවෙන් මැණික් බදු ආදායම් ගිණුමෙන් ඉඩම් බදු ගිණුමට සම්පූර්ණ මුදල ජර්නල් සටහන් මඟින් මාරුකිරීම තුල මෙම වරද සිදුවී ඇත. ඉදිරියට මෙවැනි වැරදි සිදුනොවන ලෙසට අදාල අංශ දැනුවත් කර ඇත.	වර්ෂයේ ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඊ)	කොමිෂන් සභාව විසින් පොල් වගා කිරීමේ මණ්ඩලයට බදු දුන් ඉඩම් අක්කර 812 රූඩ් 2 පර්චස් 22 කට අදාලව අයවිය යුතු රු.31,688,608 ක් වූ පරිහරණ ගාස්තු හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	මෙම පරිහරණ මුදල් සහ බදු මුදලට අදාල ගැටළුව සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමින් සාකච්චා කරමින් පවතින අතර එකී සාකච්චා වල ප්‍රතිඵල අනුව අයවිය යුතු පරිහරණ ගාස්තුව 2025 මූල්‍ය ප්‍රකාශන වල ගැලපීමට කටයුතු කරනු ලබන බව දන්වමි.	පරිහරණ ගාස්තු හඳුනා ගෙන ගිණුම්ගත කළයුතුය.
(උ)	මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු කළුගල් බදු, ඉඩම් බදු, වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ සම්බන්ධයෙන් විධිමත් ගිවිසුම් වලට එලඹ නොතිබීමත් දීර්ඝ කාලීනව අය නොවී පවතින ශේෂ පැවතීමත්, ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු නොකිරීමත් හා රු.466,314,236 ක් වටිනා ලැබිය යුතු ශේෂ 54 ක සහ රු.7,105,291 ක් වටිනා ගෙවිය යුතු ශේෂ 17 කට අදාල ශේෂ සනාතන නොලැබීම හේතුවෙන් එම ශේෂයන්හි	මුදල් අංශය විසින් ණයගැති ශේෂ සනාථන ලිපි 21ක් යවා ඇති අතර එහි පිටපත් විගණන අධිකාරි වෙත ද යවා ඇත. ඉන් 06ක් සඳහා මේ වන විට පිලිතුරු ලැබී ඇත.මීට අමතරව ඉතිරි ණය ගැති ශේෂ 34 න් 32 ක් සඳහා ශේෂ සනාථන ලිපි විගණනයටද පිටපත් සහිතව අදාල බදුකරුවන් වෙත අදායම් අංශය විසින් යොමු කර ඇතත් ඉන් කිසිවකටත් පිළිතුරු ලැබී නොමැත. ඉතිරි ණයගැති ශේෂයන්	ලැබිය යුතු හා ගෙවියයුතු ශේෂ සනාත කර එම ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය.

	නිරවද්‍යතාව විගණනයට තහවුරු කර ගත නොහැකි විය.	සඳහා අදාල ඉඩම්වල පවත්නා ගැටළුමය තත්වයන් හේතුවෙන් යොමුකර නැත.ණයහිමි ශේෂ සනාථන ලිපි 04 ක් යවා ඇති අතර එහි පිටපත් විගණන අධිකාරිය වෙත ද යවා ඇත. ඉන් 01 ක් සඳහා මේ වන විට පිලිතුරු ලැබී ඇත.	
(ඌ)	රාජ්‍ය ආයතන 05 කින් ලැබිය යුතු වර්ෂ 20 හා 30 ඉක්මවූ එකතුව රු.2,134,923,858 ක ශේෂයන්ට අදාළව එම ආයතන වලින් කොමිෂන් සභාවට ගෙවීමට කිසිදු ශේෂයක් නොමැති බවත් දන්වා තිබුණි. එම ශේෂයන් අයවිය යුතු බව සනාථ කිරීමට ලිපි ලේඛන කොමිෂන් සභාව සතුව නොතිබීම හේතුවෙන් අයකර ගැනීම අවිනිශ්චිත වූ අතර ඒ සඳහා වෙන් කිරීම කර නොතිබුණ බැවින් අදාල ශේෂයේ නිරවද්‍යතාව තහවුරු කර ගත නොහැකි විය.	වෙළඳ හා අනෙකුත් ශේෂය වූ රු.3,600,705,896 ක් 2024 වර්ෂයේ ගිණුම් වල පෙන්නුම් කර ඇත.ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ රාජ්‍ය වැවිලි සංස්ථාව,එම මුදලින් රු.2,068,913,696 ක් අයකරගැනීම සඳහා අවස්ථා ගණනාවක උත්සහ දැරුවත් එම මුදලක් ඔවුන්ගේ ගිණුම් වල නොපෙන්වන බව දන්වා ඇත. එබැවින් කාලය ගත වී ඇති බැවින් ගිණුම් වලින් කපා හැරීමට යෝජනා කල ද 1972 වර්ෂයේ සිට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති ඉඩම් වල පරම අයිතිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතුව පවතින බැවින් මෙවැනි විශාල මුදලක් කපා හැරීමෙන් ආයතනයට සිදුවිය හැකි අගතිගාමී තත්වය සලකා බලා එම මුදල තවදුරටත් ඒ ආකාරයෙන්ම ඉඩම් ප්‍රතිසංස්කරණ ගිණුම් වල පැවතිය යුතු බවට 2024.08.28 වැනි දින පැවති 811 වැනි කොමිෂන් සභා වාරයේ දි තීරණය කර ඇත. විවිධ සේවා සමුපකාර සමිති,සමඟ පැවති සාකච්ඡා වල ප්‍රතිඵලයක් ලෙස 2023 වර්ෂයේ අයවිය යුතුව තිබූ රු.3,126,685 ක මුදලින් 2024 වර්ෂයේ දි රු.354,597 ක මුදලක් සමුපකාර සමිති පහකින් ලැබී ඇත. මේ වන විට කොමිෂන් සභාවට මුදල් අයවෙන බැවින් එම මුදල් අයකර ගැනීමටත් විධිමත්ව එම ඉඩම් සමුපකාර සමිති වෙත පැවරීමට ඉදිරි කටයුතු කරගෙන යාමට උපදෙස් දෙන ලදී.ඉඩම් අමාත්‍යාංශයේ අයවිය යුතු මුදල් සම්බන්ධයෙන් එම අමාත්‍යාංශය දැනුවත් කර ඇත.හදබිම අධිකාරිය මේ වන විට කොමිෂන් සභාවට මුදල් අයවෙන බව ඉඩම් පැවරීම් අංශයෙන් දැනුම් දී ඇත ඒ අනුව වර්ෂ අවසානයේ	ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් වෙත දන්වා මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

		ගිණුම් වලින් අඩුකර දැක්වීමට තීරණය කරන ලදී. මැතිවරණ කොට්ඨාශ සමුපකාර සමිති සම්බන්ධයෙන් පළාත් සමුපකාර දෙපාර්තමේන්තු වෙත ගොස් තොරතුරු විමසා බලා ගිණුම් වල පෙන්නුම් කරන මැතිවරණ සමුපකාර සමිති පවතී ද නැතහොත් ඇවර කර ඇත්නම් සමුපකාර සමිතිය පිහිටුවා ඇති ඉඩම් පිලිබඳ තොරතුරු සොයා බලා ලැබෙන තොරතුරු කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර තීරණයක් ලබාගැනීමට කටයුතු කරනු ඇත.	
(එ)	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා ඇති වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂය රු.3,600,705,896 ක් වන අතර ඒ තුල අවුරුදු 5 ට වැඩි , 10 ට වැඩි හා අවුරුදු 20 ට වැඩි ශේෂයන් පිළිවෙලින් රු.307,034,880 ක්,රු.161,394,692ක් හා රු.2,346,279,038 ක් විය. අයකර ගැනීම අවිනිශ්චිත වූ එම දීර්ඝකාලීන රු.2,814,708,610ක ශේෂ සඳහා 1988 වර්ෂයේ සිදු කරන ලද රු.8,270,355 ක වෙන්කිරීමක් හැර කිසිදු වෙන් කිරීමක් මේ දක්වා සිදුකර නොතිබුණි.	මූල්‍ය ප්‍රකාශන තුල බොල්ණය ලෙස වෙන්කර ඇති රු.8,270,355 ක මුදල බොල්ණය ලෙස වෙන්කර ඇත්තේ 1998 වර්ෂයේ දීය. එසේ වෙන් කිරීමෙන් සිදුකර ඇත්තේ විවිධ සේවා සමුපකාර සමිති, මැතිවරණ කොට්ඨාශ සමුපකාර සමිති සහ සරප් අංශයේ අයවිය යුතු ණයගැති ශේෂයන් සඳහා වෙන් කරන ලද බොල්ණය මුදලකි. 1998 පසු මේ දක්වා වෙනත් කිසිදු බොල්ණය වෙන්කිරීමක් සිදුකර නොමැති අතර 2025 වර්ෂයේ සිට බොල්ණය වෙන් කිරීම සම්බන්ධව ප්‍රතිපත්ති තීරණයක් ගැනීම සඳහා මෙම විගණන විමසුම ද සම්බන්ධ කර කොමිෂන් සභාව වෙත කොමිෂන් පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබයි.	ණයගැති ශේෂයන් සඳහා බොල් ණය වෙන් කිරීම් කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මූල්‍ය ප්‍රකාශන වල විවිධ ණයගැතියන් යටතේ පෙන්නුම් කරන කළුතර සහ ගම්පහ දිස්ත්‍රික්ක දෙකෙහි පිහිටි ඉඩම් කැබලි 08 ක් බදුගත් පුද්ගලයින්ගෙන් අයවිය යුතු රු.2,311,017 ක් වර්ෂ 25 කට වැඩි කාලයක සිට හිඟව පැවතුණද,අදාළ බදු මුදල් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.	විවිධ ණයගැතියන් යටතේ පෙන්වා ඇති කළුතර සහ ගම්පහ දිස්ත්‍රික්ක දෙකෙහි පිහිටි ඉඩම් කැබලි 08 ක් බදුගත් පුද්ගලයන්ගෙන් අයවිය යුතු රු.2,311,017 ක මුදල් මින් පෙර මුදල් ගෙවා ඔප්පු ලබාගෙන ඇති බව හඳුනා ගෙන ඇත.මෙම කරුණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර අතර 2025.03.18 දින පැවති 816 වැනි කොමිෂන් සභාවේ පත්‍රිකා අංක 12990 අනුව මෙම වරද ගිණුම් වලින් නිවැරදි කිරීමට අනුමැතිය ලැබී ඇත.ඒ අනුව	හිඟ බදු මුදල් අයකළ යුතුය.

2025 මූල්‍ය ප්‍රකාශන තුලින් මෙම ණයගැති ශේෂය නිවැරදි කිරීමට කටයුතු කරනු ලබයි.

1.6.2 ගෙවිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉඩම් විකුණුම් අත්තිකාරම් ශේෂය වූ රු.11,322,992 ක් තුල වර්ෂ 12 කට වැඩි කාලයක සිට පැවත එන එකතුව රු.11,202,992 ක ශේෂයක් ඇතුළත්ව ඇති අතර එම විකුණුම් අත්තිකාරම් ශේෂයට අදාල ඉඩම් හඳුනාගෙන නිරවුල් කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.	මෙම විකුණුම් අත්තිකාරම් ශේෂයට අදාල ඉඩම් සම්බන්ධයෙන් හඳුනගැනීමට කටයුතු කරමින් පවතින අතර ඒ අනුව ඉදිරියේදී මෙම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.	විකුණුම් අත්තිකාරම් පියවීම පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු.14,080,850 ක් වූ ඉඩම් බදුකුලී අත්තිකාරම් ගිණුම් ශේෂයේ ඇතුළත් පුද්ගලයින් 269 දෙනෙකුගෙන් ලබාගත් රු.11,215,850 ක අත්තිකාරම් මුදල් වර්ෂ 19 කට වැඩි කාලයක සිට රඳවාගෙන තිබුණ ද, අදාළ ඉඩම් නීත්‍යානුකූලව බදු දීමට හෝ අත්තිකාරම් නැවත පියවීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.	මෙම ශේෂය තුල ඇතුලත් 2002–2004 කාල සීමාව තුල ඉඩම් බදුදීම්වලට අදාළ ගණුදෙනු කැබිනට් තීරණයක් මගින් අත්හිටුවා ඇති අතර ඊට අදාලව ඉදිරිපත් කර ඇති කැබිනට් පත්‍රිකාවට අමාත්‍ය මණ්ඩල තීරණය ලද පසු එකී තීරණය අනුව ඉදිරි කටයුතු කරනු ලැබේ.	ඉඩම් බදුකුලී අත්තිකාරම් නිරවුල් යුතුය.
(ඇ)	කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන හි වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ තුල ඇතුලත් වූ නෛතික ලියවිලි මුද්දර ගාස්තු අත්තිකාරම් මුදල වූ රු.6,582,904 ක ශේෂය වසර 03 කට වඩා වැඩි කාලයක සිට නිරවුල් නොවී පවතින බව නිරීක්ෂණය විය.	මුද්දර ගාස්තු අත්තිකාරම් මුදල් ඉඩම් විකුණුම් සඳහා මුදල් ලබා ගන්නා අවස්ථාවේ දී අයකරනු ලබයි. එසේ ලබා ගනු ලබන මුද්දර අත්තිකාරම් මෙම නෛතික ලියකියවිලි මුද්දර ගාස්තු අත්තිකාරම් ගිණුම තුල පවතින අතර එම ගිණුමේ පියවීම් සිදුවන්නේ ඔප්පු නිකුත් කිරීමක් සිදුවන අවස්ථාවේ දී පමණි. මෙම ගිණුම තුල 2024.12.31 දිනට පවතින රු.6,582,904 ක මුදල් වසර 3 ක් තුල පවතින ශේෂයන් නොවේ. 2024.01.01 දිනට මෙම ගිණුම තුල රු.6,139,325 ක් පැවති අතර ඉන් 2024 වර්ෂය තුල දී රු.1,905,070 ක මුදලක් පිය වී ඇති අතර අළුතින් 2024 වර්ෂයේ දී රු. 2,348,649 ක මුදලක් ලබාගෙන තිබේ. මේ අනුව නෛතික ලියකියවිලි මුද්දර ගාස්තු අත්තිකාරම් ගිණුමේ ශේෂය වසර 03 ක කාලයක සිට පියවීමක් සිදු වී නොමැත යන්නට එකඟ විය නොහැක.	අත්තිකාරම් පියවීමට පියවර ගත යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 44 (ඕ) වගන්තිය	වගන්තියට පටහැනිව කොමිෂන් සභාව විසින් සේවයෙහි යොදවා ගෙන සිටින තැනැත්තන් සඳහා අර්ථ සාධක අරමුදලක් පිහිටුවීම හා සුභසාධන හා විනෝද ක්‍රීඩා පහසුකම් සහ නිවාස හා නේවාසිකාගාර හා වෙනත් ඉඩකඩ සැපයීම සිදුකල යුතුය යන්න පදනම්ව කොමිෂන් සභාවේ වසර 5ක අඛණ්ඩ සේවයක් නිම් සේවකයෙකු හට පර්චස් එකක් රු.1,000 ක වටිනාකමට පර්චස් 20 බැගින් ලබා දීමට අදාළව විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා නිලධාරීන් 395 ක් වෙත ඉඩම් අක්කර 49 පර්චස් 35.64 ක් ලබා දී තිබුණි. ඉදිරියේදී ඉඩම් ලබා දීමේ අරමුණින් කොමිෂන් සභාවේ සේවකයින් 120 දෙනෙකුගෙන් රු.10,000 බැගින් රු.1,200,000 ක් වටිනා අත්තිකාරම් මුදලක් ද ලබාගෙන තිබුණි.	ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 44 (ඕ) වගන්තිය අනුව යමින් වර්තමානයේදී පමණක් නොව 1982-1984 කාල වකවානු වලදී ද සේවක පදනම මත ඉඩම් කොටස් ලබාදීම සිදුකර ඇති අතර එම කාල වකවානුවේදී ප්‍රදේශයෙන් ප්‍රදේශයට ඉඩම් කොටස් ලබා දීම පර්චස් 10 හෝ පර්චස් 20 ඉක්මවන පරිදි වූ ප්‍රමාණයන්ගෙන් ඉඩම් ලබා දීම සිදුකර ඇති බව ලේඛන වල සඳහන්ව පවතී. කොමිෂන් සභාව විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීන්දු තීරණය ප්‍රකාරව යමින් මේ වන විටත් ක්‍රියාත්මක සේවකයින්ට ඉඩම් කොටස් ලබා දීමේ වැඩපිළිවෙල යටතේ විවිධ ප්‍රදේශ වලින් ඉඩම් කොටස් හඳුනාගැනීමෙන් පසුව සේවක පදනම මත ලබා දීමට කටයුතු කර ඇති බව සඳහන් කරමි.	පනතේ අර්ථ නියමානුකූලව අර්ථකතනය කර ගනිමින් ක්‍රියාකළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 1.1 ඡේදය	රාජ්‍ය සේවයේ තනතුරක් දරන යම් නිලධාරියෙක් රාජ්‍ය සේවයේ වෙනත් තනතුරක සේවය භාරගැනීම සඳහා තමා දරන තනතුරෙන් මුදවා ගත යුතු වුවද, නිලධාරියකු 2020 ඔක්තෝම්බර් 23 දින සිට 2022 මාර්තු 31 දින දක්වා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ව්‍යපෘති අධ්‍යක්ෂ තනතුරේ සේවය කරමින් සිටියදී, 2021 ජනවාරි 01 දින සිට මග නැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගමේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) තනතුර සඳහා වසරක පරිවාස කාලයකට යටත්ව ස්ථීර පදනම මත සේවයට බැඳී තිබුණු අතර එකම කාලය තුළ ආයතන 02 න්ම ම වැටුප්	අමාත්‍යවරයාගේ බලතල යටතේ බදවාගත් නිළධාරියෙකු බවත්, නැවත මුදල් ගෙවන ලෙස ලිපි මගින් දැනුම් දුන් නමුත්, ඔහු විසින් ලබා ගත් මුදල සාධාරණීකරණය කරමින් ලිපියක් යොමු කර ඇත. දැනට නීතිපති වෙතින් මේ සම්බන්ධව උපදෙස් ඉල්ලා ඇතත් මෙතෙක් උපදෙස් ලැබී නොමැත.	නොසැලකිලිමත්ව ගෙවන ලද වැටුප් හා දීමනා අයකරගත යුතුය.

හා දීමනා ලබාගෙන තිබුණි. ඒ අනුව කොමිෂන් සභාව විසින් අදාළ නිලධාරියාගේ පැමිණීම සහ ලබාදෙන සේවය පිළිබඳව සැලකිලිමත් නොවී වැටුප් හා දීමනා ලෙස 2020 ඔක්තෝබර් සිට 2022 මාර්තු දක්වා රු.2,038,979 ක මුදලක් ගෙවා තිබුණු අතර එම මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.283,260,782 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.636,050,744 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.352,789,062 ක පසුබෑමක් නිරීක්ෂණය විය. මෙම පසුබෑමට ආදායම හා මූල්‍ය ආදායම් රු.338,643,718 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

(අ) පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ, ඉඩම් පරිහරණ ගාස්තු සියයට 482 කින් වැඩිවන විට ඉඩම් අත්පත්, විකුණුම් ආදායම් ,ඉඩම් බදු කුලී ආදායම් සහ ස්ථාවර තැන්පතු පොලී ආදායම පිළිවෙලින් සියයට 7, සියයට 28 , සියයට 24 හා සියයට 63 ක අගයන්ගෙන් අඩුවී තිබුණි.

(ආ) පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ප්‍රවාහන දීමනා, අතිකාල දීමනාව,වාහන කුලී සහ ප්‍රවාහන ගාස්තු හා නීති ගාස්තු පිළිවෙලින් සියයට 16,21,92 කින් සහ 4 කින් අඩු වී තිබුණද සේවක පාර්තෝෂික සියයට 331කින් වැඩිවී තිබුණි. තව ද ප්‍රසාද දීමනා වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් කර නොතිබුණි.

2.3 අනුපාත විශ්ලේෂණය

(අ) සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය 9 : 1 ක් වූ අතර 2023 වර්ෂයේ එම අනුපාතය 4 : 1 ක් විය. ඒ අනුව ජංගම අනුපාතය පෙර වර්ෂයට සාපේක්ෂව ඉහළ අගයකින් පවත්වාගෙන ගොස් තිබුණු අතර කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වලට වැඩියෙන් ජංගම වත්කම් වල මුදල් ආයෝජනය කර ඇති බව නිරීක්ෂණය විය.

(ආ) 2023 වර්ෂයේ සියයට 34 ක් ව පැවති තෝලන අනුපාතය සමාලෝචිත වර්ෂයේදී සියයට 18 ක් දක්වා පහළ ගොස් තිබුණද, කොමිෂන් සභාව විසින් මුලු වගකීම් පියවීමට අවශ්‍ය ප්‍රමාණයට වැඩි හිමිකම් ප්‍රාග්ධනයක් පවත්වාගෙන ගොස් ඇති බව නිරීක්ෂණය විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණයෙ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	උරුමය ඔප්පු ප්‍රදානෝත්සවයට සමගාමීව 'සැමට හිමි බිමක්' ඔප්පු ප්‍රධානෝත්සවය 2024 මාර්තු 30 දින මහනුවර බෝගම්බර ක්‍රීඩාංගනයේදී පවත්වා එහිදි ඔප්පු 2,700 ක් පමණ බෙදා දී තිබූ අතර ඒ සඳහා රු,10,106,158 ක	විවිධ ප්‍රදේශයන්හි ඉඩම් වල නීත්‍යානුකූල හිමිකමක් නොමැති තැනැත්තන් 2,700 දෙනෙකු සඳහා නියමිත ගාස්තු අයකර ඔප්පු ලබාදීම සඳහා කොමිෂන් සභා අනුමැතිය 2023.08.25 දිනැතිව ලබා ගැනීමට කටයුතු කර ඇත. ඉඩම් බැහැර කිරීම සම්බන්ධයෙන් 2023.05.25 දිනැතිව ජනාධිපති ලේකම් කාර්යාලය විසින් ඉඩම් බැහැර කිරීමට අදාළ කටයුතු තාවකාලිකව	ඉඩම් බැහැර කිරීමේදි අත්‍යාවශ්‍ය වියදම් සඳහා පමණක් වියදම් කල යුතුය.

වියදමක් දරා තිබුණි.	අත්හිටුවීම යන මැයෙන් සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්ටද පිටපත් සහිතව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ලිපියක් යොමුකොට තිබූ අතර, එකී ලිපියේ දෙවන ඡේදය ප්‍රකාරව දැනටමත් ඉඩම් බැහැර කිරීම සම්බන්ධයෙන් යම්කිසි කාර්යයක් ඉටුකරන්නේනම් ඒ සම්බන්ධව ජනාධිපති කාර්යාලය දැනුවත් කරන ලෙස දැනුම් දී තිබුණි. ඒ අනුව 2024.03.15 දිනැතිව ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් මගින් ජනාධිපති ලේකම් වෙත දිස්ත්‍රික් කාර්යාල මට්ටමින් ලබා දීමට නියමිත ඔප්පු සංඛ්‍යාව පිළිබඳ වාර්තාවක් දැනගැනීම සඳහා යොමු කිරීමට කටයුතු කර ඇත. ගරු සංචාරක හා ඉඩම් අමාත්‍යතුමන්, ගරු ජනාධිපතිතුමා සමඟ කරන ලද සාකච්ඡාව අනුව ඔප්පු ලබා දීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස උපදෙස් දුන් බවත්, ඒ අනුව එම කාර්යයන් ඉටුකරන ලෙසත් මෙම කොමිෂන් සභාව දැනුවත් කර ඇත. මෙම උත්සවය හිටපු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාපතිතුමා ඇතුළු වෙනත් රාජ්‍ය ආයතන ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් සාකච්ඡාවක් පවත්වා එම සාකච්ඡාවේදී ද 2024.03.30 දින මහනුවර බෝගම්බර පිටියේදී පැවැත්වීමට නියමිත ඔප්පු ප්‍රධානෝත්සවය පිළිබඳ දැනුවත් කිරීමක් සිදු කිරීමට කටයුතු කර ඇති බව දන්වා සිටිමි.	
(ආ) 2016 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ග්‍රෙගරි මාවතේ හා අංක 475, කඩුවෙල පාර, බත්තරමුල්ල යන ස්ථානයේ කුලී පදනම මත ආයතනය පවත්වා ගෙන ගොස් තිබූ අතර එයට පිළියම් ලෙස 2023 නොවැම්බර් 07 දිනැති අංක අ.ම.ප. 23/186/615/002 – II දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉඩම් අමාත්‍යාංශයේ සිවුවන මහලේ කාර්යාල ගොඩනැඟිල්ල ඉදි කිරීමට අමාත්‍ය මණ්ඩලය ලබා දුන් අනුමැතිය නොසලකා කුලී පදනම මත කාර්යාල කටයුතු පවත්වාගෙන ගිය බත්තරමුල්ලේ පිහිටි ගොඩනැඟිල්ල රු.මිලියන 240 ක මිලකට 2024 ජුනි මස මිලදීගෙන තිබුණ අතර එම ගොඩනැඟිල්ල හෝටලයකට සුදුසු ලෙස ගොඩනැගිල්ල තුල ජල තටාක, පැසේජ් හා කොරිඩෝ පිහිටා තිබීම හා අඳුරු ස්වභාවයක්	2016.12.01 දින සිට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලය පවත්නා අංක 475, කඩුවෙල පාර, බත්තරමුල්ල යන ස්ථානයේ කුලී පදනම මත පවත්වාගෙන යමින් පවතින අතර, වරින් වර අවස්ථා ගණනාවකදී විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුව, කුලී පදනම මත වෙනත් ගොඩනැගිල්ලක් වෙත යොමු වීමට උත්සහා කර 2024 ජුනි 25 වන දින අමාත්‍ය මණ්ඩල සංදේශ අංක අමප/24/1153/615/014 – I ප්‍රකාරව සහ විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ මෙම ගොඩනැගිල්ල මිලදී ගැනීමට කටයුතු කරන ලදී. පර්චස් 29 ක පිහිටා ඇති ගොඩනැගිලි පරිශ්‍රයට අමතරව එයට යාබදව පිහිටි පර්චස් 6.5 ක නිස් භූමි ප්‍රමාණයද ඇතුළත්ව මිලියන 240 ක වටිනාකමට අදාළ තක්සේරු වාර්තාද ලබාගනිමින් අදාළ ගොඩනැගිල්ල සහ යාබද ඉඩම මිලදී ගැනීම සිදුකරන ලදී. මෙම ගොඩනැගිල්ල සංවර්ධනය කලයුතු බවට හඳුනාගෙන ඇති අතර, එකී කටයුතු මේ වන විටත් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සමඟ සිදුකරමින් පවතින බවද, ඒ අනුව, පුළුල් ඉඩකඩ පහසුකම් සහිතව ලේඛනාගාරය	ගොඩනැගිල්ල සහිත පරිශ්‍රය සංවර්ධනය කර අඩුපාඩු නිවැරදි කළ යුතුය.

ගැනීම හේතුවෙන් කාර්යාලයකට සුදුසු ගොඩනැගිල්ලක් නොවන බව නිරීක්ෂණය විය.

පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇති බවද වැඩිදුරටත් සඳහන් කරමි.

වර්තමාන ගොඩනැගිල්ල තවදුරටත් සංවර්ධනය සහ ඉඩකඩ පහසුකම් පුළුල් කිරීම සඳහා මධ්‍යම උපදේශක කාර්යාංශය ආයතනය පත්කරමින් 2024.08.28 දිනැති 811 වැනි කොමිෂන් සභා වාරයේ අංක 12894 දරන කොමිෂන් සභා පත්‍රිකාව මඟින් අනුමැතිය ලබාගැනීම සිදුකර ඇත.

ඒ අනුව, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය ආයතනය විසින් ගොඩනැගිල්ල සහිත පරිශ්‍රය සංවර්ධනය කිරීම සඳහා සහ යාබද ඉඩමේ නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ කාර්ය සම්බන්ධව යෝජනාවලිය සහ ගිවිසුම සැකසීමේ කටයුතු මේ වන විට සිදුකරමින් පවති.

(ඇ) මාතලේ බෙගෲප් වත්තෙන් ඉඩම් අක්කර 1723 ක් ප්‍රකාශ කළ අයෙකුට ව්‍යවස්ථාපිත නිශ්චය යටතේ එම ඉඩමෙන් අක්කර 50 ක් 191/7 දරණ ගැසට් පත්‍රයෙන් පිඹුරු අංක 404 හා 497 මඟින් ලබාදී තිබියදී නැවත පිඹුරු අංක 2229 හා 2230 මඟින් හුවමාරු ඔප්පු අංක 1653 මඟින් අක්කර 32 ක් ලබා දී තිබුණි. මෙම ඉඩම නකල්ස් රක්ෂිතයට පවරා ගන්නා බව පවසමින් කොළඹ දිස්ත්‍රික්කයෙන් අක්කර 25 ක් ලබා දීමට කොමිෂන් සභාව අනුමත කර ඉන් අක්කර 11 ක් ඔප්පු අංක 15725 යටතේ ලබා දී තිබුණි. ඉහත හුවමාරු ඔප්පුව මඟින් ලබා දුන් අක්කර 32 ඔප්පුව අවලංගු කිරීමට කොමිෂන් සභාව තීරණය කර තිබුණද එය අවලංගු කර නොතිබුණු අතර එම ඉඩම ඔහු විසින් විකුණා තිබුණ බවද අනාවරණය විය. මෙම ඉඩම් රජය මඟින් අත්පත් කරගෙන ඇත්ද යන්න ලග්ගල ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් සිදුකළ තහවුරු කර ගැනීම් වලට අනුව එම ඉඩම් අත්පත් කරගෙන නොමැති බව අනාවරණය විය. ලග්ගල වැනි ඉතා දුර බැහැර දුෂ්කර ප්‍රදේශ වලින් ප්‍රකාශ කළ මහ/403 ප්‍රකාශක සිදම්බරම් රෙන්ගනාදන් මහතාගේ ව්‍යවස්ථාපිත නිශ්චය බෙගෲප් නැමති ඉඩමෙන් මා/404 යටතේ මැණුම් කර නොබෙදූ අක්කර 50 ක ප්‍රමාණයක් අංක 178/2 හා 1975.08.25 දිනැතිව අති විශේෂ ගැසට් පත්‍රයේ පල කර ඇත. අංක මා/404 පිඹුරේ අදාළ ඉඩම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දී ඇති බව සඳහන් වන බැවින් ව්‍යවස්ථාපිත නිශ්චය සංශෝධනය කර මා/404 පිඹුරේ කැබලි අංක 05 ස හ මා/407 කැබලි අංක 05 සහ 07 හි බ්‍රේගෲප් නැමති ඉඩමේ නොබෙදූ අක්කර 50 ක ප්‍රමාණයක් අංක 191/7 හා 1982.05.06 දිනැති රජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙන් ලබා දී ඇත. බ්‍රේගෲප් වත්ත නැමති ඉඩම වන සංරක්ෂන දෙපාර්තමේන්තුවට අත්පත් කර ගන්නා බැවින් නැවතත් ව්‍යවස්ථාපිත නිශ්චය සඳහා ගැසට් කරන ලද ඉඩමෙන් අක්කර 32 ක ප්‍රමාණයක විකල්ප ඉඩම් ලබා දීමට 1983.03.07 දින අනුමත කර ඇත.ඒ අනුව අංක 2229 සහ 2230 මඟින් අක්කර 32 ක ප්‍රමාණයක් අංක 1653 ඔප්පුව මඟින් ප්‍රකාශක වෙත ලබා දී ඇත. එම ඉඩම් ප්‍රමාණය විකුණා ඇති බවට විගණනය මඟින් කර ඇති නිගමනය තහවුරු වේ.

එසේ වුවත් සිදම්බරම් රෙන්ගනාදන් යන අය කරන ලද ඉල්ලීමක් පරිදි ඉහත සඳහන් අක්කර 32 ක ප්‍රමාණය වෙනුවට කොළඹ දිස්ත්‍රික්කයේ ගනේතොට වත්ත ඉඩමෙන් විකල්ප ඉඩම් ලබාදෙන ලෙස ඉල්ලීමක් කර ඇත. ඒඅනුව අංක 15723 දරණ ඔප්පුව මඟින් අක්කර 11 ක ප්‍රමාණයක් විකල්ප ලෙස ලබා දීමට කටයුතු කර ඇත. කෙසේ වෙතත් බ්‍රේගෲප් නැමති සම්පූර්ණ ඉඩම වන සරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවතින බව දිස්ත්‍රික් අධ්‍යක්ෂ පවසන බැවින් හා ඒ සඳහා අත්පත් යෝජනා ඉදිරිත් කරන බව පවසන බැවින් එවැනි ඉඩමක බුක්තිය ආපසු ලබා ගැනීමට හැකියාවක් නැත.

විමර්ශනයක් සිදුකර එ අනුව වගකිව යුතු අයට එරෙහිව නෛතිකව කටයුතු කළ යුතුය.

නොබෙදූ ඉඩම් වෙනුවෙන් කොළඹ වැනි ජනාකීර්ණ මිල අධික ප්‍රදේශ වලින් ඉඩම් ලබා දීමට කටයුතු කර තිබූ අතර මෙහිදී මෙම පුද්ගලයා වෙනුවෙන් යොදන ලද ඔහුගේ අත්සන මුලින් යොදන ලද අත්සන් සමඟ නොගැලපෙන බව නිරීක්ෂණය විය.

එසේම සිදම්බරම් රෙන්ගනාදන් යන අයගේ අත්සන් පිළිබඳව අත්අකුරු පරීක්ෂක ලවා විශේෂ තහවුරුවක් ලබා ගත යුතු වේ.

(ඇ) කොමිෂන් සභාවට අයත් ගම්පහ දිස්ත්‍රික්කයේ පිහිටි හෙක්ටයාර් 28.52 ක ප්‍රමාණයේ ඉඹුල්ගස් වාඩිය නමැති ඉඩම ජනතා වතු සංවර්ධන මණ්ඩලයට පවරා දී ,මණ්ඩලය මඟින් දීර්ඝ කාලීන බදු පදනම මත 1992 වසරේ සිට වසර 53 කට හලාවත වැවිලි සමාගම වෙත පවරා දී තිබුණි. එම ඉඩමෙන් කොමිෂන් සභාව 2021 අගොස්තු 05 දිනැති අංක 2239/38 දරණ ගැසට් පත්‍රය මඟින් අක්කර 25 ක් නැවත පවරාගෙන කොමිෂන් සභාව වෙත ඉඩම් ප්‍රකාශ කළ තැනැත්තෙකුගේ දරුවෙකුගේ දරුවන් දෙදෙනෙකු වෙත විකල්ප ඉඩම් පැවරීම යටතේ පවරා දී තිබුණි. මෙලෙස දරුවන්ගේ දරුවන්ට ඉඩම් පැවරීමට කොමිෂන් සභා පනතේ ප්‍රතිපාදන නොමැති අතර මෙම පැවරීම සම්බන්ධයෙන් ජනාධිපති හා ඉඩම් අමාත්‍යාංශ ලේකම් යන අයගේ විරෝධතාවයද කොමිෂන් සභාව විසින් නොසලකා හැර තිබූ අතර ඉතා දුර බැහැර ප්‍රදේශ වලින් ප්‍රකාශ කළ නොබෙදූ ඉඩම් වෙනුවෙන් ජනාකීර්ණ මිල අධික ප්‍රදේශ වලින් ඉඩම් ලබා දී ඇති බවත් මේවන විට මෙම ඉඩම කට්ටි කඩමින් ඉහල මිල ගණන් වලට විකුණමින් ඇති බවත් නිරීක්ෂණය විය.

ගම්පහ දිස්ත්‍රික්කයේ පිහිටි ඉඹුල්ගස්වාඩිය ඉඩම කොා/1717 ප්‍රකාශක විසින් අක්කර 105 රූඩ් 2 පර්චස් 26 ක ප්‍රමාණයක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට ප්‍රකාශ කර ඇත.එම ඉඩම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 28.52 ක ප්‍රමාණයක් (අක්කර 70 රූඩ් 1 පර්චස් 36) අංක 468/21 හා 1987.08.28 දිනැති රජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් 1972 අංක 1 දරණ ඉඩම් ප්‍රතිසංස්කරන පනතේ 22, 23 හා 42 ඈ වගන්ති වලට යටත්ව ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත භාර දී ඇත. පසුව එම ඉඩම ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් හලාවත වැවිලි සමාගම වෙත භාර දී ඇත.

ඉඩම් ප්‍රතිසංස්කරණ පනත ප්‍රකාරව නිතිමය බැදීම වශයෙන් ප්‍රකාශකගේ දරුවෙකු වන මාලනි නානායක්කාර මියගේ (මියගොස්) උරුමකරුවන් වෙත අක්කර 25 ක ප්‍රමාණයක් මෙම ඉඩමෙන් ලබාදෙන ලෙස ඉල්ලා ඇත.

ඒ අනුව අංක 11485 කොමිෂන් තීරණය යටතේ 2021.07.08 දිනැනිව ඉඹුල්ගස්වාඩිය ඉඩමෙන් අක්කර 25 ක ප්‍රමාණයන් අවසතු කර ගැනීමට තීරණය කර ඇත. එම ඉඩම් ප්‍රමාණය නිදහස් කර ගැනීම සඳහා ජනතා වතු සංවර්ධන මණ්ඩලය හලාවත වැවිලි සමාගම් 2020.12.17 දිනැනි අංක 2020-12/10/ PL05 දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව යටතේ ලබා දුන් එකඟතාවය 2020.12.31 දිනැතිව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පවරා ඇත.

ඒ අනුව අංක 2239/38 හා 2021.08.15 දිනැති ගැසට් පත්‍රය මගින් අදාල ඉඩම් කොටස අවසතු කර ඇත. මෙම අවසතු කර ගැනීම සම්බන්ධයෙන් හලාවත වැවිලි සමාගම විසින් CA(W)416/2022 නඩුව ගොණු කර ඇතත් විවාදයට ගැනීමට පෙර අදාල පෙත්සම්කාර සමාගම විසින් ඉල්ලා අස්කරගෙන ඇත.

පසුව අදාල ඉඩම් කොටස 15180 දරන ඔප්පුව මගින් ප්‍රකාශකගේ දරුවකු වන මාලනි නානායක්කාර මියගේ (මියගොස්) උරුමකරුවන් වන ධම්මික මෙන්ඩිස් හා රාජිකා මෙන්ඩිස් යන අය වෙත කොමිෂන් සභාව විසින් බැහැර කර ඇත.

ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව

විමර්ශනයක් සිදුකර එ අනුව වගකිව යුතු අයට එරෙහිව නෛතිකව කටයුතු කළ යුතුය.

දරුවන් සඳහා ඉඩම් ලබාදීමට පනතේ ප්‍රතිපාදන සලසා ඇතත්, මුණුපුරන්ට ලබාදීමට ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ ප්‍රතිපාදන සඳහන්ව නැත. කොමිෂන් සභාව සිය අභිමතය පරිදි තැනැත්තන්ට සිදු වන්නා වූ අසාධාරණයන්ට එක් එක් අවස්ථා වල මතුව ඇති ප්‍රායෝගික ගැටළු මත සහන සැලසීම සඳහා වෙනත් ප්‍රතිපාදන පරිදි ක්‍රියාත්මක වූ අවස්ථාවන් ඇත.

(ඉ) භාණ්ඩාගාර ලේකම්ගේ 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන රාජ්‍ය වියදම් පාලන චක්‍රලේඛයේ 2 වන වගන්තිය ප්‍රකාරව ගොඩනැගිලි කුලියට ගැනීම නතර කළ යුතු බවද දක්වා ඇතත් සභාවේ දිස්ත්‍රික් කාර්යාල 06 ක් පෞද්ගලික පාර්ශවයන්ට අයත් ගොඩනැගිලි වල කුලී පදනම මත පවත්වා ගෙන යාම වෙනුවෙන් 2023 හා 2024 වර්ෂ වලට අදාළව බදු කුලීය ලෙස රු.37,811,393 ක් දරා තිබුණි. සභාව ආරම්භකර දැනට වසර 50 කට ආසන්න වූවත් සභාවට අයත් ඉඩම්වල කාර්යාල පිහිටුවා ගැනීමට කළමනාකරණය අපොහොසත්වී ඇති බව ද තවදුරටත් නිරීක්ෂණය විය.

කුලී පදනම මත පවත්වා ගෙන යනු ලබන දිස්ත්‍රික් කාර්යාල රජයේ ගොඩනැගිලිවල ස්ථාපිත කිරීම සඳහා ඉඩ පහසුකම් තිබේද යන්න සොයා බැලුවද ඉඩ පහසුකම් සොයාගත නොහැකි විය. ඒ අනුව, දිස්ත්‍රික් කාර්යාල 08 ක් පුද්ගලික ගොඩනැගිලිවලත්, දිස්ත්‍රික් කාර්යාල 09 ක් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සතු ගොඩනැගිලි තුළත් පවත්වා ගෙන යනු ලබන අතර, දිස්ත්‍රික් කාර්යාල 03 ක් කොමිෂන් සභාව සතු ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබයි.
කෙසේ වෙතත් භාණ්ඩාගාර ලේකම්ගේ 2024.02.28 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2024 මඟින්ද, නව ගොඩනැගිලි රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව කුලී පදනම මත ලබා ගැනීම අත්හිටුවා ඇති නමුත්, බදුකුලී ගිවිසුම් පදනම මත දැනටමත් පවතින ගොඩනැගිලි පිරිවැය ඵලදායිතාවය අගයමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත තවදුරටත් දීර්ඝ කිරීමේ හැකියාව පවතින බව දක්වා ඇත.

දිස්ත්‍රික් කාර්යාල රජයේ ගොඩනැගිලිවල ස්ථාපිත කිරීම සඳහා පියවර ගත යුතුය.

(ඊ) කොමිෂන් සභාවට අයත් ගාල්ල කුරුදුගහ හැතැප්මේ පර්.31.5 ක ඉඩම සහිත ගොඩනැගිල්ලේ ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය පවත්වාගෙන යාමට කටයුතු නොකර ගාල්ල නගරයට ආසන්නයේ පිහිටි පර්.9.79 ක් වූ ඉඩමක පිහිටි ගොඩනැගිල්ලක් කුලියට ගෙන එම කාර්යාලය පවත්වා ගෙන යාම හේතුවෙන් 2018 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා ගොඩනැගිලි කුලී ලෙස රු.5,805,000 ක නිශ්කාර්ය වියදමක් දරා තිබුණි. මේ වන විට සභාවට ගාල්ල කුරුදුගහ හැතැප්ම පිහිටි කොමිෂන් සභාවට අයත් ගොඩනැගිල්ල ඉඩම් හිමිකම් නිරවුල්කිරීමේ දෙපාර්තමේන්තුවට කාර්යාලය සඳහා මසකට

කොමිෂන් සභාව සතු කුරුදුගහ හැතැප්ම පිහිටි ගොඩනැඟිල්ල 2018 වර්ෂයේ ඔප්පු දස ලක්ෂයේ වැඩපිළිවෙල නියාමන ව්‍යාපෘතිය ගාල්ල දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගෙන පැවැත්වූ බැවින්,මෙහෙයුම් කටයුතු සඳහා උප කාර්යාලයක් ලෙස මෙම ස්ථානය පවත්වාගෙන ගොස් ඇති අතර, ගාල්ල දිස්ත්‍රික් සමස්ථ කාර්යය මණ්ඩලය සඳහා ප්‍රමාණවත් ඉඩපහසුකම් නොමැති වීම, ගාල්ල නගරයේ සිට කුරුදුගහ හැතැප්ම උප කාර්යාලය පිහිටි ගොඩනැගිල්ල සඳහා ආසන්න වශයෙන් සාමාන්‍ය මාර්ගයෙන් කිලෝමීටර් 39 ක දුරින් ඇති අතර, දක්ෂිණ අධිවේගී මාර්ගය හරහා ගමන් කිරීමට ගාල්ල සිට පින්නදුව පිවිසුම හරහා කිලෝමීටර් 37 ක දුරින් ඇති බැවින් ද ඒ සඳහා පොදු ප්‍රවාහන පහසුකම් නොමැති බැවින්ද, යක්කලමුල්ල, නෙළුව, තවලම, නාගොඩ සහ වදුරඹ යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල ජනයාට එහි ලහාවීමේදී මහත් දුෂ්කරතාවයක් ඇති බැවින් ද, නිළධාරීන් කාර්යාලයට පිවිසීමේදී ප්‍රවාහන අපහසුතා ඇති බැවින් ද එම ස්ථානයේ ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය පවත්වාගෙන යාම ගැටළු සහගත විය.

පිරිවැය අවම වන ආකාරයට කටයුතු කළ යුතුය.

	රු.22,000 කට කුලියට දී තිබුණි.	රාජකාරි සිදුකිරීමේදී ගාල්ල නගරයට මහජනතාවට හා නිලධාරීන්ට පහසුවෙන් ලභාවිය හැකි ස්ථානයක් අවශ්‍ය වූ බැවින්, රජයේ තක්සේරුව නොඉක්මවන බැවින් ද වෙනත් රාජ්‍ය ආයතන වලට ආසන්නවීම යනාදි කරුණු හේතුවෙන් දැනට ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය ස්ථාපිත ගොඩනැඟිල්ල මාසික බදු කුලිය මත තෝරාගෙන ඇත. මේ වන විට රජයේ තක්සේරුව මත ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශිය කාර්යාලයක් පවත්වා ගැනීම සඳහා බදු පදනම මත ලබාදී ඇත.	
(උ)	කොමිෂන් සභාවේ ඒකාබද්ධ ගිණුම්කරණ මෘදුකාංග පද්ධතියක් 2019 මැයි 22 දින පුද්ගලික ආයතනයකින් රු.8,500,000 කට මිලදී ගෙන තිබුණ ද, එම තොරතුරු පද්ධතිය මගින් ලැබිය යුතු ඉඩම් බදු මුදල් පිළිබඳ තොරතුරු පද්ධතිය මාර්ගයෙන් ලබාගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.	ලැබිය යුතු බදු මුදල් පිළිබඳ තොරතුරු ලබා ගතහැකි ආකාරයෙන් මෘදුකාංග පද්ධතිය සකස් කරදෙන ලෙසට එම ආයතනයෙන් වාර කිහිපයක දී ඉල්ලිම් කර ඇති අතර ඔවුන් විසින් කිහිප විටකදී අප ආයතනය වෙත පැමිණ පද්ධතිය සැකසීමේ කටයුතු ද සිදු කරන ලදී. එහෙත් මේ වනවිටත් එය සකසා අවසන් කර නොමැත.	ස්ථාපිත කරන ලද ඒකාබද්ධ ගිණුම්කරණ මෘදුකාංග පද්ධතිය මගින් ලැබිය යුතු ඉඩම් බදු මුදල් පිළිබඳ තොරතුරු ලබාගැනීමට හැකි අකාරයට සකස් කළ යුතුය.
(ඌ)	සභාව සඳහා, පූර්ණ ඒකාබද්ධ පරිගණක පද්ධතියක් නිර්මාණය කිරීම, සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා 2002 වර්ෂයේ දී පෞද්ගලික සමාගමක් වෙත ගෙවා තිබුණු රු.17,000,000 ක මුදල නැවත ලබා ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගන්නා ලෙස 2022 පැවති රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවට දන්වා ඇතත් ඒ අනුව කටයුතු කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.	මෙම කරුණට අදාලව නීති සහය ඉල්ලා නීතීපති දෙපාර්තමේන්තුව වෙත 2023.08.24 දාතමින් යුතුව ලිපියක් යොමු කර ඇති අතර 2023.09.06 දාතමින් යුතුව නීතීපති දෙපාර්තමේන්තුව මෙම කොමිෂන් සභාව වෙත ලිපියක් යොමු කර ඇත. එකී ලිපිය අනුව 2023.11.03 දින රජයේ අධිනීතීඥතුමිය සමඟ දුරකථන සාකච්ඡාවක් පවත්වා තිබේ. ඉන් අනතුරුව 2023.11.14 දින රජයේ අධිනීතිඥතුමිය වෙත ඇය විසින් විමසන ලද තොරතුරු යොමු කර ඇත.ඒ අනුව 2024.12.20 දාතමින් යුතුව සිය උපදෙස් ලබා දෙමින් රජයේ අධිනීතිඥවරිය විසින් පෙන්වා දෙන ලද්දේ කාලාවරෝධී ආඥා පනතේ 6 වන වගන්තිය ප්‍රකාරව මුදල් නීත්‍යානුකූලව ආපසු ලබා ගැනීමට නොහැකි බවයි. තවද නව සමාගම් පනත ප්‍රකාරව එකී ඉන්ෆොසැට් සමාගම අලුතින් සංස්ථාපනය කර නොතිබීම නිසා ඊට නෛතික පුද්ගලභාවයක් නොමැති බව පිළිබඳව ද පෙන්වා දී ඇත.	ගෙවූ මුදල නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(එ)	සභාවේ ඉඩම් මැනුම් කර නියමානුකූල කරන අවස්ථාවේ කට්ටිකරුවන්ගෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට යටත්ව ඉඩම් මැනුම් කර බලයලත් මිනින්දෝරුවන්හට	ඔප්පු දසලක්ෂයක් බෙදා දීමේ වැඩසටහන යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ මැනුම් නොකරන ලද ඉඩම් කඩිනමින් මැනුම් කිරීම සඳහා ක්‍රියාත්මක වූ ව්‍යාපෘතියකට යටත්ව ඉඩම් මැනුම් කර බලයලත් මිනින්දෝරුවන් හට 2019, 2020 හා 2021 යන වර්ෂ	කට්ටිකරුවන්ට ඉඩම් ලබාදෙන අවස්ථාවේදී මැනුම් ගාස්තු අය කළ යුතුය.

	2019,2020 හා 2021 යන වර්ෂ වලදී ගෙවා තිබුණු එකතුව රු.33,229,487 ක මුදලින් සමාලෝචිත වර්ෂය වන විට රු.9,954,378 ක් පමණක් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණු අතර එදිනට තවදුරටත් ලැබිය යුතු ශේෂය රු.23,275,108 ක් විය.	වලදී ගෙවා තිබුණු රු.33,229,486.36 ක මුදලින් රු.9,954,377.00 ක මුදලක් ප්‍රතිපූර්ණය කරගෙන තිබුනු අතර තවදුරටත් ලැබිය යුතු ශේෂය වූ රු.23,275,109.36 ක මුදලක් අය කර ගැනීමට කටයුතු කරමින් පවති.	
(ඒ)	කොමිෂන් සභාවට අයත් නාවලපිටිය ටිල්ටන් වත්ත ඉඩමේ තේ කර්මාන්ත ශාලාව සහිත අක්කර 02 රූඩ් 01 පර්චස් 05 ක ප්‍රමාණය තිස් අවුරුදු බදු පදනම මත 1997 අගෝස්තු 30 දින සිට වාර්ෂික බදු කුලිය රු.270,000 බැගින් සී/ස සුපර් ඉන්ඩස්ට්‍රිස් ඇන් එක්ස්පෝර්ට් පුද්ගලික සමාගම වෙත ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22(1) ආ වගන්තිය යටතේ බදු දී තිබුණි.පසුව 2008 වර්ෂයේදී පුද්ගලයෙකු විසින් ඉහත ආයතනයේ වෙළඳනාමය සමඟ ඉඩම පවරා ගෙන ඇතත් මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාව අනුමැතියක් හා ගිවිසුමකට එළඹීමකින් තොරව අවිධිමත් ලෙස භුක්තිවිදීමට සභාව විසින් ඉඩදීම හේතුවෙන් 1997 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා වසර 27 ක් වෙනුවෙන් අයවිය යුතු බදු මුදල රු.18,403,926 ක් අදාළ බදු කරුවන්ගෙන් අයකර ගෙන නොතිබුණි.	2008 වසරේදී මෙම ඉඩම් කොටස පවරාගෙන 2022 වසර දක්වා බදු නොගෙවීම හේතුවෙන් නාවලපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 79899/18 හා 2021.03.26 දිනැති නඩු තීන්දුව ප්‍රකාරව ඔහුව මෙම දේපළින් නෙරපීම සඳහා නියෝගයක් නිකුත් කර ඇත. මෙම නඩු තීන්දුව අනුව ඉඩමේ භුක්තිය බාරගෙන නැවත නාවලපිටිය විවිධ සේවා සමූපකාර සමිතිය වෙත බදු පදනම මත ලබාදී ඇත. හිඟ බදු මුදල තිලක් කුමාර උඩගම යන අයගෙන් අයකර ගැනීම සම්බන්ධයෙන් 2024.01.10 දාතමින් යුතුව නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. දුරකථනයෙන් අවස්ථා කිහිපයකදී අවධානය යොමු කරන ලද අතර 2024.11.04 වන දින රජයේ ජොෂ්ඨ අධිනීතිඥවරයා වෙත ලිඛිතව දැනුම් දී ඇත.නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලැබුණු පසු ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.	හිඟ බදු අය කළ යුතුය.
(ඔ)	ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22(1)(ආ) වගන්තිය ප්‍රකාරව, ගාල්ල අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ලෙව්වමී බී වත්ත නැමැති ඉඩමෙන් අක්කර 08 ක් අවුරුදු 30 ක කාලයක් සඳහා වසර 5 න් 5 ට බදු සමාලෝචනය කරමින් 2005 වර්ෂයේ තක්සේරු වටිනාකමට එම වර්ෂයේ සිට “සහන ළමා සංවර්ධන පදනමට” බදු පදනම මත ලබා දීමට 2014 වර්ෂයේදී කටයුතු කර තිබුණු අතර, අදාළ	මෙම ඉඩම් බදු පදනම මත ලබාගත් ස්වාමින් වහන්සේ අපවත් වී ඇත. බදු නොගෙවීම හා ස්වාමින් වහන්සේ අපවත් වීම සම්බන්ධයෙන් 2021.03.26 දින පැවති කොමිෂන් සභා වාරයේ දී කොමිෂන් සභාවට කරුණු පැහැදිලි කල අතර එහි දී ඉඩමේ ඒකපාර්ශවීය භුක්තිය භාර ගැනීමට තීරණය කර ඇත. කොමිෂන් තීරණ ප්‍රකාරව ඉඩමේ භුක්තිය නැවත කොමිෂන් සභාව වෙත භාරගෙන ඇත. හිඟ බදු අයකර ගැනීමට අදාලව නීතිපති වෙතින් උපදෙස් ලබාගෙන ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.	පවරාගත් ඉඩම පනතේ අරමුණු වෙනුවෙන් යොදාගත යුතු අතර හිඟ බදු අය කර ගැනීමට ද පියවර ගත යුතුය.

	ඉඩම සම්බන්ධයෙන් ගැටලු සහගත තත්ත්වයක් ඇති වූ බව පවසමින් ඉඩමේ භුක්තිය ඒකපාර්ශිකව කොමිෂන් සභාව වෙත 2021 වර්ෂයේදී පවරාගෙන ඇතත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන දින වන විටත් සහන ළමා සංවර්ධන පදනමෙන් හිඟව පැවති රු.6,998,800 ක මුදල අයකර ගැනීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.		
(ඕ)	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු හොරණ, වෑවල, හෑගල්ල වත්ත බංගලාවත්ත ඉඩම කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාහේන උතුර 615 බී ග්‍රාම නිලධාරී වසමට අයත් ඉඩමෙහි නොබෙදූ අක්කර 14 රූඩ් 1 පර්චස් 9.9 ක ඉඩම ස්වාමීන් වහන්සේ නමක්(මියගිය) අවිධිමත් ලෙස අක්කර 5 ක්ද, තවත් පෞද්ගලික ඉඩම් හිමිකාරියක් අනවසර ලෙස පර්චස් 66 ක ප්‍රමාණයක්ද , බුක්ති විඳිමින් සිටියද පනතේ 16 වගන්තිය ප්‍රකාරව ඒ පිලිබඳව නීතිමය කටයුතු කර නොතිබුණි.	හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි හෑගල්ල වත්ත කොමිෂන් සභාව වෙත ප්‍රකාශිත ඉඩමක් වේ. මෙම ඉඩමට අදාලව කොමිෂන් සභාව විසින් ස්වාමීන් වහන්සේට එරෙහිව පොලිස් පැමිණිලි සිදුකර නෙරපීමට අදාල නීතිමය කටයුතු ආරම්භ කර ඇත.අනවසරයෙන් භුක්තිවිඳින ස්වාමීන් වහන්සේ උක්ත ඉඩමෙන් නෙරපීම සඳහා 1979 අංක 07 දරණ රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතේ 03 වන වගන්තිය ප්‍රකාරව අස්කිරීමේ දැන්වීම් සභාපතිතුමාගේ අත්සනින් යුතුව යොමුකර ඇත. එකී අස්කිරීමේ දැන්වීමේ නියමිත දින වන්නේ 2025.04.28 වන දිනවේ. එසේ උවත් ඉඩමේ භුක්තිය සම්බන්ධයෙන් ගැටළු සහගත තත්වයක් මතු වී ඇති බැවින් ක්ෂේත්‍ර තත්වය විමසූ අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය. සුජාතා වීරකෝන් නැමති අය විසින් කොමිෂන් සභාවට එරෙහිව අභියාචනාධිකරණ නඩුවක් ගොණු කළත්, එහි තීරණය කොමිෂන් සභාවට වාසි සහගත අයුරින් ලබා දී ඇත. දැනට ඇය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොණුකර ඇති බැවින් ඉදිරි කටයුතු සිදු කිරීම නතර වී ඇත.	අනවසර භුක්තිකරුවන් වෙනුවෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.
(ක)	කොළඹ දිස්ත්‍රික්කයේ කොළොන්නාව වැල්ලම්පිටිය ප්‍රදේශයේ පිහිටි ජාකොටුව වත්ත ඉඩමෙන් රූඩ් 01 පර්චස් 9.79 ප්‍රමාණයක් කොමිෂන් සභා පනතේ 22(1) ආ,ඇ වගන්ති යටතේ වාර්ෂික බදු කුලිය රු.1,590,000 ක් බැගින් පුද්ගලයෙකු වෙත පවරා තිබුණි. මෙම ඉඩමේ වෙළඳපල වටිනාකම මත එය රු.26,500,000 කට තක්සේරු කර ඇතත් එම තක්සේරු වටිනාකම මත ගණනය කරන ලද බදු කුලිය ඉතා ඉහළ	ජාකොටුව වත්ත නැමති ඉඩමෙන් කොටසක් සරත්චන්ද්‍ර මහතා වෙත බදු පදනම මත ලබා දීමට තක්සේරුව කැඳවා ඇතත් එම තක්සේරුව අධික බව පවසීම හේතුවෙන් නැවත තක්සේරුව කැඳවා ඇත. ඊට අදාල තක්සේරුව මේ දක්වා ලැබී නැත. එසේ වුවත් මෙම බදුකරු සහ ඉඩමේ කට්ටිකරුවෙකු අතර නඩු අංක CAW34/2024 නඩුව ගොනුකර ඇති අතර ඒ සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවද පාර්ශවකරුවෙකු කර ඇත.අධිකරණ තීන්දුව ලැබීමෙන් පසු ඉදිරි පියවර ගනු ලැබේ.	රජයේ තක්සේරුව මත බදු අය කළ යුතුය.

	අගයක් බැවින් එය ගෙවිය නොහැකි බව බදුකරු දන්වා තිබුණු අතර මේ දක්වා කිසිදු බදු මුදලක් අය වී නොතිබුණි.		
(ග)	කොමිෂන් සභාව සතු කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි රාගෙදර වත්ත ඉඩමෙන් අක්කර 70 ක් මිනිරන් කැනීම සඳහා රජයේ තක්සේරුකරුගේ වර්තමාන තක්සේරු වටිනාකම මත වර්ෂ 05 ක කාලයක් සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව පුද්ගලික සමාගමක් වෙත බදු දීමට 2011 ඔක්තෝබර් 18 දිනැති 7751 වන කොමිෂන් පත්‍රිකාව මගින් අනුමැතිය ලබාදී තිබුණි. කෙසේ වුවත් 2011 වර්ෂයේදී බදු දී ඇති මෙම මිනිරන් සහිත ඉඩම සඳහා 2024 දෙසැම්බර් 31 දින දක්වා ලැබුණු රු.8,937,144 ක් අත්තිකාරම් ලෙස ගිණුම්ගත කර තිබුණි. එසේම විගණිත දිනය වන විටත් වර්ෂ 13 ක් පමණ ගතවී තිබුණ ද තක්සේරු කර බදු ගණනය කර අයකර ගැනීමට හා දෙපාර්ශවය අතර බදු ගිවිසුමකට එළඹීමට කොමිෂන් සභාව මේ දක්වා අපොහොසත් වී තිබුණි.	මෙම ඉඩමට අදාලව 2022.08.18 දින ප්‍රධාන තක්සේරුකරු වෙතින් තක්සේරුව කැඳවා ඇති නමුත් එකී තක්සේරුව නොලැබීම මත නැවත 2023.03.29 දිනැතිව පළාත් තක්සේරුකරු වෙත සිහි කැඳවීමක් යොමුකර ඇත. ඒ අනුව රජයේ තක්සේරුව නොලැබීම හේතුවෙන් දල තක්සේරුව මත පදනම්ව මේ වන විට රු.8,937,144 ක මුදලක් අය කරගෙන ඇත. ඒ අනුව තක්සේරු වාර්තා ලැබුනු පසු අදාල ගැලපිම් කර ඕහ බදු මුදල අයකරගෙන විධිමත් බදු ගිවිසුමක් ලබාදීමට කටයුතු කරනු ලැබේ.	විධිමත් බදු ගිවිසුමකට එළඹී රජයේ තක්සේරුව මත බදු අය කිරීමටත් කටයුතු කළ යුතුය.
(ච)	ගම්පහ දිස්ත්‍රික්කයේ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි ගලිඹුරේ වත්ත ඉඩමෙහි කැබලි අංක 01 හි අක්කර 12 රූඩ් 02 පර්චස් 4.48 ක පිහිටි කළුගල සහිත ඉඩම 2011 ජූලි 26 දිනැති කොමිෂන් පත්‍රිකා අංක 7628 මගින් පුද්ගලයෙකු වෙත බදු පදනම මත ලබා දී තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දින වන විට රු.5,590,000 ක් ඉඩම සඳහා ලැබිය යුතුව තිබුණි. තව ද මෙම ඉඩම බදු දී වර්ෂ 13 ක් පමණ ගතවී ඇතත් අදාළ බදුකරු කළුගල මෙතෙක් ඉවත්කර නොමැති බැවින් ඒ සඳහා ගතයුතු	බදු ගෙවන ලෙස බදුකරු වෙත දැනුම් දී ඇත.එසේ වුවත් මෙම කළුගල කඩා ඉවත්කර නොමැති බවට වාර්තා කර ඇත. නීතිමය පියවර ගැනීමට අදාලව බදුකරුවෙත 2024.11.01 දින එන්තරවාසියක් යොමුකර ඇත.ඒ අනුව මුදල් ගෙවීමට කටයුතු කර නොමැති බැවින් බදුදීම අවලංගු කර නීතිමය කටයුතු කිරීමට නියමිතව ඇත.	බදු පදනම මත ලබා දුන් කළුගල් පිළිබඳ සොයා බැලීමටත් බදු මුදල් අය කර ගැනීමටත් කටයුතු කළ යුතුය.

	ක්‍රියාමාර්ග සභාව විසින් නොගැනීම හේතුවෙන් එමගින් උපයා ගැනීමට හැකිව තිබූ ආදායමක් අහිමි වී තිබුණු බව නිරීක්ෂණය විය.		
(ඡ)	බදුල්ල දිස්ත්‍රික්කයේ කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි තල්පිටිය වත්ත නමැති ඉඩමට අදාළ පිඹුරු අංක 801 කැබලි අංක 01 කොටසෙහි අක්කර 04 ක තිරුවානා ගල, කළුගල් බදු පදනම යටතේ 2012 මාර්තු 28 දිනැති කොමිෂන් පත්‍රිකා අංක 7928 මගින් බදු දී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.5,653,566 බදු මුදලක් ඉඩම සඳහා ලැබියයුතුව තිබුණි.කෙසේ නමුත් කොමිෂන් සභාව විසින් ඛණිජ සම්පත් බදු දීමේදී බදු මුදල් අයකළ යුතු නිශ්චිත ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබීම හේතුවෙන් මෙම තිරුවානා ගල බදු පදනම මත ලබා දී සමාලෝචිත වර්ෂය වන විට වසර 12කට ආසන්න කාලයක් ගත වී ඇතත් එම ඛණිජ සම්පත තුළින් කොමිෂන් සභාව උපයාගත් ආදායම මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගෙන නොතිබුණි.	අයවිය යුතු මුදලට අදාලව මුලින් සියයට 50 ක මුදල පලමුව ගෙවන බවටත් ඉතිරිය රු.500,000 ක් බැගින් වාරික 03 ක් වශයෙන් ගෙවන බවට 2024.09.13 දිනැතිව බදුකරුගේ පුතා වන එන්.ඩි.ආර්.එස්.දසනායක මයා විසින් ලිඛිතව එකඟතාවය ලබා දී ඇත. ඒ අනුව වැටි ඇතුලත්ව රු.500,000 බැගින් වාරික 02 ක් 2024.09.13 සහ 2025.01.31 දිනැතිව ගෙවීම් කර ඇත. මෙම ඉඩම බදු පදනම මත ලබාදුන් බදුකරු මියගොස් ඇති අතර නීතිමය පියවර ගැනීම කල හැකි ද යන්න පිළිබඳ නීති අංශය මඟින් විමසා බලා ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.	අයකළ යුතු ගාස්තු ක්‍රමය තීරණය කර ඒ අනුව හිඟ මුදල් ද ඇතුළුව බදු අය කළ යුතුය.
(ට)	ඉඩම් ලේඛනය තුළ කළුගල් බදු දුන් පුද්ගලයින් 211 දෙනෙකු වෙත අක්කර 645 පර්චස් 10.58 ක බදුකරුවන් 103 දෙනෙකුට අදාළව ලැබිය යුතු බදු ආදායම් පමණක් 2024 මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කර තිබුණි. ඒ අනුව කොමිෂන් සභාව සතු ඛණිජ සම්පතක් වන කළුගල් කැඩීම පිළිබඳපසු විපරමක් සිදුකර නිසි පරිදි බදු ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.	කළුගල් සම්බන්ධව ගොනු 211ක් සඳහා ආයතන හා පුද්ගලයින් වෙත බදු පදනම මත ලබා ගැනීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් වී තිබුණද, ආයතන නිර්දේශ නොලැබීම, ගම්වාසීන්ගේ විරෝධතා, නීතිමය තත්වයන් හා වෙනත් කරුණු හේතුවෙන් එම සියලු ව්‍යාපෘති සම්බන්ධයෙන් ඉදිරිකටයුතු සිදුවී නොමැත. කළුගල් බදු දීමට අදාලව ආදායම් අංශය මඟින් බදු ලෙජරයක් පවත්වාගෙන නොයාම තුල සියලුම කළුගල් ව්‍යාපාර වලට අදාල බදු ගැලපිම සිදු කර නොතිබුණි. 2023.09.15 දිනැති කොමිෂන් සභාව මඟින් මේ සම්බන්ධයෙන් කොමිෂන් සභා අනුමැතිය මත අදාල ගැලපීම් සිදුකර වර්තමානය වන විට නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කර ඇත.වර්තමානයේ ක්‍රියාත්මක කළුගල් බදු දීම සම්බන්ධව ඉඩම් ලේඛණයේ තොරතුරුද නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී	බදු දුන් කළුගල් ඉඩම් ආදායම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය.

(ඩ)	2021 වර්ෂයේ රු.මි. 350 ක් යොදා ගනිමින් ආරම්භ කර තිබූ කාබනික පොහොර ව්‍යාපෘතිය මඟින් ලබාගෙන තිබූ ආදායම රු.මි.22 ක් පමණක් වීම මත මෙම ව්‍යාපෘතිය අසාර්ථක ව්‍යාපෘතියක් ලෙස 2022 වර්ෂයේදී අවසන් කර තිබුණි. ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මි.31 කට අධික කාර්යාල උපකරණ, යන්ත්‍ර සූත්‍ර මිලදී ගෙන තිබුණ අතර මෙම වත්කම් වලින් රාජ්‍ය ආයතන වෙත කොටසක් බෙදා දී තිබුණි. ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2023 මාර්තු 28 දිනැති අ.ම.ප. 23/383/615/017 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ව්‍යාපෘතියේ අසාර්ථකත්වයට හේතු හා ඒ සඳහා දායක වූ පාර්ශවයන් පිළිබඳව ස්වාධීන විමර්ශනයක් සිදු කිරීමට සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් ඉඩම් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් 2023 අප්‍රේල් 29 දිනැතිව පත්කර වාර්තාව සති දෙකක් තුළ ඉදිරිපත් කරන ලෙස දක්වා තිබුණද එම වාර්තාව 2025 මැයි 30 දින දක්වා ඉදිරිපත් කර නොතිබුණි. අමාත්‍යාංශ ලේකම්වරයා විසින් 2023 නොවැම්බර් 14 දින පත්කරන ලද කමිටුවක් මඟින් ව්‍යාපෘතියේ භාණ්ඩ හා යන්ත්‍රෝපකරණ ගුවන් හමුදාව, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, ඇල්ල ප්‍රාදේශීය සභාව වෙත භාර දී තිබූ අතර රු.මි.22 ක් වැයකර ඉදිකරන ලද අඩි 40 x 100 ප්‍රමාණයේ පොහොර අංගන 5 ක් නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය.	යන්ත්‍ර සූත්‍ර සහ පොහොර නිෂ්පාදනයට උපයෝගි කර ගනු ලැබූ සියළුම යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ අමාත්‍යාංශ විසින් පත්කරන ලද කමිටුවක නිර්දේශ අනුව ත්‍රිවිධ හමුදාවට, ශ්‍රී ලංකා ගුවන් හමුදාවට, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට හා ඇල්ල ප්‍රාදේශීය සභාවට භාර දී ඇත.මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් බඳවාගත් සේවකයින් කිහිපදෙනෙකුට අදාලව සේවක අර්ථසාධක හා භාරකාර අරමුදල වෙත ගෙවිය යුතු රු 367,625 ක මුදල ගෙවීමට නොහැකි වී ඇත්තේ එම සේවකයින්ගේ තොරතුරුවල පවත්නා ගැටළු හේතුවෙනි. මෙම ගෙවිය යුතු මුදල කාබනික පොහොර ව්‍යාපෘතියට අදාල ගිණුමට බැර කර ඇත.දැනට අවසන් කර ඇති මෙම ව්‍යාපෘතියේ කටයුතු 2022.07.14 දින සිට රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බැවින් මෙම ගොඩනැගිලි සම්බන්ධයෙන් අමාත්‍යාංශය මගින් ගනු ලබන තීරණ මත ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.	විමර්ශනයක් සිදුකර එ අනුව වගකිව යුතු අයට එරෙහිව නෛතිකව කටයුතු කළ යුතුය.
(ත)	කොමිෂන් සභාව විසින් පවරා ගත් ඉඩම් වෙනුවෙන් වන්දි ගෙවීමේ අරමුණින් ඉඩම් බැහැර කිරීමෙන් ලැබෙන ආදායම, ඉඩම් විකුණුම් ආදායම හා කුඹුරු ඉඩම් විකුණුම් ආදායමින් විධිමත් අනුමැතියකින් තොරව සියයට 40 ක් බැගින්	සියයට 40 බැගින් වාර්ෂික වෙන්කරන ලද සංචිත මුදල් වන්දි ගෙවීම සඳහා වෙන්කරන ලද අතර එම මුදල් 2020 වර්ෂය දක්වා ආයතනය තුල ස්ථාවර තැන්පතු ලෙස පවත්වාගෙන යන ලදී. නමුත් 2021 වර්ෂයේ සිට අවස්ථා කිහිපයක දී මහා භාණ්ඩාගාරයේ ඉල්ලීම මත රු.මිලියන 1,465 ක මුදලක් මහා භාණ්ඩාගාරය වෙත ලබාදෙන ලදී. තවද, ආයතනයේ පැවති නඩුවක් සඳහා	සංචිතයක් ඇති කිරීමේදි භාණ්ඩාගාර අනුමැතියකින් කළ යුතුය.

	වාර්ෂිකව වෙන් කර සංචිතයක් ඇතිකර පවත්වාගෙන ගිය අතර එම සංචිතයේ වටිනාකම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. මිලියන 2,474 ක් වුවත් එම සංචිතය ඇති කල අරමුණින් බැහැරව වරින් වර රු. මිලියන 2,535 කට ආසන්න මුදලක් වැය කර තිබුණි.	වන්දි මුදල් ලෙස රු.මිලියන 500 ක් ද, ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල මිල දී ගැනීම සඳහා රු.මිලියන 250 ක් ද, ආයතනික ආදායම් බදු ගෙවීම සඳහා රු.මිලියන 320 ක මුදලක් ද වශයෙන් මුළු මුදල් ලෙස රු.මිලියන 2,535 ක් වැය කිරීමට සිදු විය.ඒ අනුව මේ වන විට ආයතනය තුල සංචිත වල ප්‍රමාණවත් මුදලක් ආයතනයේ තැන්පතු තුල නොපවතින බව සඳහන් කර සිටිමි.	
(ද)	ඇත්හොඩගල නින්දගමේ ඉඩමෙන් අක්කර 49 රූඩ් 3 පර්චස් 30 ක ප්‍රමාණය එක් සමාගමක් වෙත 2006 සැප්තැම්බර් 01 දිනැති අංක 495 දරණ බදු ගිවිසුම මඟින් බදු දී තිබුණ අතර, හිඟ බදු නොගෙවීම මත 2018 අගෝස්තු 11 දින බදු ගිවිසුම අවලංගු කර තිබුණ බව නිරීක්ෂණය විය. පසුව හිඟබදු නොගෙවීමට එරෙහිව ආයතනයට එරෙහිව පවරන ලද නඩුවක් හේතුවෙන් 2022 වර්ෂයේ අවසානයට හිඟ බදු මුදල සම්පූර්ණයෙන් ගෙවා තිබීම නිසා පවරන ලද නඩුව නැවත නඩු පැවරීමේ අයිතියට යටත්ව 2023.03.10 දින ඉල්ලා අස්කරගෙන තිබුණි. කෙසේ වෙතත් 2024.03.31 දිනට හිඟ බදු මුදල් රු. 5,604,252 ක බදු මුදල අයකර ගැනීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණ අතර ඉහත බදු පදනම මත ලබා ගත් ඉඩම එම සමාගම මඟින් තවත් සමාගමක් වෙත අතුරු බදු ලබා දී තිබුණි.	හිඟ බදු මුදල් ගෙවීම පැහැර හරින්නේ නම් නීතිමය පියවර ගැනීමට කටයුතු කරන බවත් ඩෙව්ල් ලංකා සමාගම සමඟ සම්බන්ධයෙන් කටයුතු කිරීමට කොමිෂන් සභාවට බැඳීමක් නොමැති බවත් දන්වා සිටිමි.	හිඟ බදු අය කර ගැනීමට පියවර ගත යුතු අතර බදු පදනම මත ලබාදුන් ඉඩම් පිළිබඳ පසු විපරම් කිරීම සිදු කළ යුතුය.

3.2 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස්	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩල පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.		

සේවක බාණ්ඩය	අනුමත සංඛ්‍යාව	තත්‍ය සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ	5	5	-
මධ්‍යම කළමනාකරණ	33	31	2
තාක්ෂණික	6	3	3
කනිෂ්ඨ කළමනාකරණ	4	3	1
• පුද්ගලික කර ඇති තනතුරු	28	20	
කළමනාකරණ සහකාර	215	135	80
• පුද්ගලික කර ඇති තනතුරු	40	40	
ප්‍රාථමික	61	37	24
එකතුව	**392**	**274**	**110**

(i) කොමිෂන් සභාවේ කෘෂිකාර්මික ඉඩම් පැවරීම, ආයෝජන සඳහා ඉඩම් පැවරීම හා ව්‍යවස්ථාපිත නිශ්චය සඳහා ඉඩම් පැවරීම යන අරමුණු ඉටුකර ගැනීම සඳහා 2018 ජුනි 27 දිනැති අංක අමප/18/1126/829/002 දරන කැබිනට් තීරණය මගින් වර්ෂයක කාලයක් සඳහා නිලධාරීන් 214 දෙනෙකු බඳවා ගැනීමට අනුමැතිය ලබා දී ඔවුන්ගේ කාර්ය සාධනය අනුව වසර 3ක කාලයක් සඳහා එම නිලධාරීන්ගේ සේවය දීර්ඝ කළ හැකි බව එහි දක්වා තිබුණි. ඒ අනුව අනුමත කාර්ය මණ්ඩලය ලෙස ජ්‍යෙෂ්ඨ කළමනාකරණ 11ක්, මධ්‍යම කළමනාකරණ 09 ක්, කනිෂ්ඨ කළමනාකරණ 21 ක්, කළමනාකරණ සහකාර 153 ක්, කාර්යාල සහායක 10 ක් සහ රියදුරු 10 ක් බඳවා ගැනීමට අනුමැතිය ලබා දී තිබුණ ද ඊට පටහැනිව කළමනාකරණ සහකාර 12 ක් හා කාර්යාල සහයක 08 දෙනෙකු වැඩිපුර බඳවා ගෙන තිබුණි. තව ද එම අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමකින් තොරව අදාළ වසර 3 අවසන් වීමෙන් පසුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියෙන් තොරව කළමනාකරණ සහකාර 138 ක්,රියදුරු 10ක් ,කාර්යාල සහයක 16 ක් සඳහා ස්ථිර පත්වීම් ලබාදී තිබුණි.

මේ පිළිබඳව අමප/24/0689/615/013 හා 2024.06.12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ලබාදී ඇත. නමුත්, කොන්ත්‍රාත් සේවකයින් පිළිබඳව එහි සඳහනක් නොමැත. 25/2014 හා 25/2014(i) යටතේ ස්ථිර කළ සේවකයින් පුරප්පාඩුව පවතින සමාන්තර තනතුරු සඳහා පත්කිරීමට එම අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලබා දී ඇත. එම අමාත්‍ය මණ්ඩල තීරණය අංක 12797 හා 2024.07.02 දිනැති කොමිෂන් පත්‍රිකාව මඟින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ අතර, 25/2014 අනුව ස්ථිර කළ සේවකයින් ජ්‍යෙෂ්ඨත්වය පදනම් කරගෙන අධ්‍යාපන සුදුසුකම් පරීක්ෂා කර තෝරා ගැනීමට අනුමැතිය හිමි වී ඇත. ඒ අනුව, කමිටුවක් පත්කර පුද්ගලික ලිපිගොනු පරීක්ෂා කර අතර, ඊට අභ්‍යන්තර විගණක ලබා දුන් වාර්තාවද සමඟ 814 වැනි කොමිෂන් සභා වාරයට ඉදිරිපත් කළ අතර, සම්මුඛ පරීක්ෂණයක් සිදුකර සුදුස්සන් තෝරා පත් කර ගැනීම සිදුකල යුතු බවත්, පරීක්ෂක මණ්ඩලය පත්කිරීමට කටයුතු කර ලකුණු ලබාදීමේ ක්‍රියාපටිපාටියක් යෝජනා කර ඉදිරි කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙසත් උපදෙස්

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු වේ අනුමැතිය අනුව සේවක සංඛ්‍යාව සංශෝධනය කළ යුතුය.

	ලබා දී ඇත. එබැවින්, අදාළ තොරතුරු 2025.03.18 දින පැවති 816 වන කොමිෂන් සභා වාරයට ඉදිරිපත් කළ අතර, අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුතු කමිටුව වෙත අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කිරීමට තීරණය ලබා දී ඇත. ඒ අනුව, 2025.03.31 දිනැතිව ලිපියක් යොමුකර ඇත.	
(ii) 2021 මාර්තු 26 දිනැති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පත්‍රිකා අංක 11384 අනුව කළමණාකාර සහකාර තනතුරු 34 ක් හා ප්‍රාථමික තනතුරු 04 ක් සඳහා (කොන්ත්‍රාත් පදනම මත) බඳවාගෙන ඇතත් ඒ සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ගෙන නොතිබුණි.	කොමිෂන් සභාවේ එවකට පැවති රාජකාරිමය අවශ්‍යතාවයන් මත කොමිෂන් පත්‍රිකාවක් යොමු කරමින් කළමනාකරණ සහකාර සහ ප්‍රාථමික තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කර ඇත. කෙසේ වෙතත්, ඒ සඳහා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතියක් ලබාගෙන නොමැති අතර, ඒ සම්බන්ධයෙන් විවිධ අවස්ථාවන්හිදී එම දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිරීමේදී ඒ සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් යොමු කරන ලෙසට උපදෙස් ලබාදී ඇත. ඒ අනුව, අංක අමප/23/0293/615/008 අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් යොමු කර ඇති අතර, උක්ත සඳහන් පරිදි කොමිෂන් පත්‍රිකා අනුමැතිය යටතේ සිදුකල පත්වීම් සඳහා අමාත්‍ය මණ්ඩල ආවරණ අනුමැතිය ලබාදීම සම්බන්ධයෙන් එකඟතාවය ලබාදිය නොහැකි බවට තීරණය ලබාදී ඇත. එලෙස බඳවා ගත් කාර්ය මණ්ඩලයේ කොන්ත්‍රාත් කාලය 2025.08.31 දිනෙන් අවසන් වීමට නියමිතව ඇත.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය අනුව සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය.
(iii) 2018 ජුනි 27 දිනැති අංක අමප/18/1126/829/002 දරන කැබිනට් තීරණය මඟින් බඳවා ගත් නිලධාරීන් 16 දෙනෙකු වෙත බඳවා ගැනීමට අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබිය දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියෙන් තොරව ස්ථීර පත්වීම් ලබාදී පර්වස් එකක් රු.1,000 ක වටිනාකමට පර්වස් 20 බැගින් ඉඩම් ද ලබාදී තිබුණි.තව ද ඉන් එක් අයෙකු 2025 පෙබරවාරි මස කොමිෂන් සභාවේ සේවය අතහැර ගොස් තිබුණි.	සේවක පදනම මත ඉඩම් කොටස් ලබා ගැනීම සඳහා මූලික සුදුසුකම ලෙස සලකනුයේ කොමිෂන් සභාවේ අඛණ්ඩව වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම හා විනය විරෝධී කටයුත්තකට භාජනය නොවූ අයෙකු වීම වේ. එම සුදුසුකම්	පනත අනුව ක්‍රියාකළ යුතුය.

සපුරා ඇති සේවක පිරිස් වරින් වර කොමිෂන් සභාව වෙත වාර්තා කර අනුමැතිය ලබා ගැනීම සිදු කර ඇති නමුදු 2020.09.16 දින පැවති කොමිෂන් සභා වාරය අවස්ථාවේදී සේවා කාලය වසර 05 ක් සම්පූර්ණ කරනු ලබන කාර්යය මණ්ඩලය වෙත ඉඩම් කොටස් ලබා ගැනීමට අදාලව පොරොත්තු ලේඛනයක් මත සිදු කරන ලෙසට උපදෙස් ලබා දී ඇත.